ඇමුණුම 04

# ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය

# ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය

**ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මෙහෙවර :**

- ගේ දොර
- වතුපිටි හෝ
- ගොඩමඩ කෘෂිකාර්මික ඉඩකඩම්:

උකසකට තබා හෝ පොරොන්දු සින්නක්කරයක් මත ගන්නා ලද ණය මුදලක් ආපසු ගෙවීම සම්බන්ධයෙන් ඇතිවන ගැටළුවකදී ඔබට අවශ්‍ය මෙහෙවර ඉටුකර දීමට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව සූදානමින් සිටී. හදිසි මුදල් අවශ්‍යතාවයකදී තම දේපල උකස් හෝ පොරොන්දු සින්නක්කර ඔප්පුවක් මත ඇපයට බැඳ, කවර පොලී අනුපාතයක් යටතේ වුවද කුමන කොන්දේසියක් මත හෝ මුදල් ලබාගත් නමුත් නියමිත කාල සීමාවට පෙර මුදල් ගෙවා ඔප්පුව ආපසු පවරා ගැනීමට නොහැකිවීමෙන් ඉතා වටිනා දේපළ, ඉඩකඩම් ඉතා සුළු මුදලකට සින්නවූ අවස්ථා බොහෝ විට දැකගත හැකි අතර, ඇතැම් විට තමන් සන්තක එකම දේපළ අන්සතු වීම නිසාම මහට බැසීමට සිදුවන අවස්ථාද විරල නොවේ. විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාවට ඔප්පු සම්බන්ධයෙන් ඇති විවිධ තරාතිරමේ කොන්දේසි ආදිය කෙරෙහි පැහැදිලි නිරවුල් අවබෝධයක් නොමැතිවීම මෙවැනි තත්ත්වයක් ඇතිවීමට ප්‍රබල හේතුවක් වී ඇත.

මෙම ප්‍රශ්නයට පිළියමක්, සහනයක් සැලසිය හැකි රජයේ ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනතින් ස්ථාපනය කර ඇත.

1999 අංක 29 දරණ (සංශෝධන) පනත අනුව හුදෙක් ණයගණුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පුවක් මත කරන ලද පැවරීමක් සම්බන්ධයෙන්ද මෙම දෙපාර්තමේන්තුවට මැදිහත්වී ණයකරුට සහනයක් සලසා දීමට අවශ්‍ය විධිවිධාන සලසා දී ඇත. මෙහිදී මෙම ගණුදෙනුව ඇත්ත වශයෙන්ම ණය ගණුදෙනුවක් සඳහාම භාරයක් නැතහොත් ඇපයක් ලෙස කරන ලද පැවරීමක් බව ණයකරු සාක්ෂි සමගින් මණ්ඩලයට ඒත්තු ගැන්විය යුතු අතර පැවරීමක් සිදුවී වර්ෂ තුනක කාලයක් ඉක්මයාමට පෙර ඉල්ලීම මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුව ඇත.

**සහනයක් සඳහා අයදුම් කළයුතු පිළිවෙල :**

අයදුම් කිරීමට අවශ්‍ය විස්තර ඇතුලත් මුද්‍රිත ඉල්ලුම්පත්‍ර මෙම දෙපාර්තමේන්තුව මගින් නොමිලයේ සැපයේ. ඒවා කොළඹ 08, ආචාර්යය එන්. එම්. පෙරේරා මාවත, අංක 35 ඒ දරණ ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් වෙත ලිපියක් එවා හෝ පැමිණ ලබාගත හැකිය.

ණය ගණුදෙනුවට අදාළ ඔප්පුවේ සහතික පිටපතක් හා ඉඩම් පිළිබඳව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත් පත්‍රිකා ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්යවේ. පොරොන්දු සින්නක්කර ඔප්පුවක් සම්බන්ධයෙන් නම් පොරොන්දු සින්නක්කරයේ කාලසීමාව ඉක්මවී යාමට ප්‍රථම සහ උකස් ඔප්පුවක් සම්බන්ධයෙන් නම් අධිකරණයක ඊට අදාලව නඩු කටයුත්තක් පැවරීමට ප්‍රථම මණ්ඩලය වෙත ඉල්ලුම් කළ

යුතු වේ. 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ආවරණය වන ණය දෙන ආයතනවලින් ලබාගත් ණය සම්බන්ධයෙන් මෙම මණ්ඩලය මැදිහත් නොවේ.

අයදුම්පත්‍රයක් ලැබීමෙන් පසු දෙපාර්තමේන්තුව අනුගමනය කරන ක්‍රියා පිළිවෙල:

01. දෙපාර්තමේන්තුවට ලැබෙන සෑම ඉල්ලුම්පත්‍රයක්ම ලැබෙන දිනය අනුව ලියා පදිංචි කර අදාළ ඉල්ලුම්කරුට එම ඉල්ලුම්පත්‍රයට අදාළ වන ඉල්ලුම්පත් අංකය නොපමාවම දන්වා යැවීමට කටයුතු කරන අතර, විමසීම් පිළිබඳව ලැබෙන සෑම ලිපියකටම තැපැලෙන් විස්තර දන්වා යැවීමට කටයුතු කරනු ලැබේ.

02. ලියා පදිංචිකරන ලද අයදුම්පත්‍ර සඳහා මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු ඉඩම් ලියා පදිංචි කිරීමේ ලේකම් වෙත හා අදාළ ණයහිමි වෙත ආඥාපනතේ විධිවිධාන අනුව තහනම් නියෝග නිකුත් කිරීම, ඉල්ලුම්කරුට මූලික විභාගය සඳහා පැමිණෙන ලෙස දන්වා නොතීසි යැවීම, සින්නක්කර ඔප්පුවක් පිළිබඳවූ ඉල්ලුම්පත්‍රයක් නම් මණ්ඩලයේ නියෝගයක් මත අදාළ ඉල්ලුම්කරුට මූලික විභාගය සඳහා පැමිණීමට දන්වා නොතීසි නිකුත් කරනු ලැබේ.

03. මූලික විභාගය, පවත්වනු ලබන දිනයේදී පොරොන්දු සින්නක්කර හෝ උකස් ඔප්පු සම්බන්ධ ඉල්ලීමක් නම්, මණ්ඩලයේ නියෝගය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීමට තීරණය කරන අතර, සින්නක්කර ඔප්පුවක් සම්බන්ධ ඉල්ලීමක් නම් විභාගය සඳහා ඊ ළඟ දිනයේදී පැමිණෙන ලෙස දන්වා අදාළ වග උත්තරකරුට නොතීසි යැවීම කරනු ඇත. ගැසට් පත්‍රයේ එම තොරතුරු පළවීමෙන් පසුව දෙපක්ෂයම කැඳවා අවසාන විභාගයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත. මෙහිදී දෙපක්ෂයේම එකඟත්වය ඇතිව සමාදාන ගිවිසුමක් ඇති කිරීම හෝ එසේ නොහැකිවන අවස්ථා වලදී අදාළ වන පරිදි සහතික නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. සින්නක්කර ඔප්පු සම්බන්ධ ඉල්ලීමක් නම් පනතේ අර්ථ නිරූපණය වන පරිදි ණයක් වශයෙන් ගැනෙන්නේ නම් 1999 අංක 29 දරණ සංශෝධිත පණතේ විධිවිධාන යටතේ අවශ්‍ය පියවර ගනු ඇත.

04. සමාදාන ගිවිසුමක් ඇති කිරීමෙන් පසුව මුදල් ගෙවීම පිළිබඳව අපහසුතා හෝ දුෂ්කරතා ඇතිවන අවස්ථාවලදී ණයකරුගේ හෝ ණයහිමියේ ඉල්ලීම පරිදි නැවත එක් වරක් පමණක් අදාළ පනතේ විධිවිධාන පරිදි සමාලෝචන විභාගයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

05. මණ්ඩලය ඉදිරියේ විභාගවීමෙන් පසු දෙන ලද තීන්දු ක්‍රියාත්මක වීමේදී ඇතිවන ගැටළු සම්බන්ධව වෙනත් අධිකරණයක නඩු පවරනු ලැබූ විට එම නඩු විභාග වන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවට කැඳවීම් ලැබෙන අවස්ථාවන්හිදී සාක්ෂිදීම සඳහා දෙපාර්තමේන්තුව ඉදිරිපත් වනු ඇත.

06. අදාළ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම පරිදි මණ්ඩලය ඉදිරියේ විභාග වන නඩු සම්බන්ධයෙන්වූ තීන්දු හා නීති කෘත්‍ය සටහන්වල සහතික පිටපත් අදාළ වන ගාස්තු ගෙවීමෙන් පසු ලබාගත හැකිය.

**ණය බේරුම් කිරීම කෙරෙන අයුරු :**

මූලික විභාගයෙන් අනතුරුව ණයහිමි හා ණයකරු යන දෙපාර්ශවයම අවසාන විභාගයක් සඳහා කැඳවා පස් දෙනෙකුගෙන් යුතු විනිශ්චය මණ්ඩලයක් ඉදිරිපිට කෙරෙන විභාගයකදී දෙපාර්ශවය විසින් ඉදිරිපත්

කරනු ලබන කරුණු මණ්ඩලයේ විනිශ්චයට භාජනය කිරීමෙන් අනතුරුව ණයකාර පක්ෂයට සහනයක් වන අන්දමේ වාරික මගින් සාධාරණ කාලසීමාවක් තුළදී ණය මුදල පියවීමේ ක්‍රමයක් යෝජනා කෙරේ. සෑම ඉල්ලුම්පතක් සම්බන්ධයෙන්ම එකම අයුරකින් නොව ඒ ඒ ඉල්ලුම්පත්‍රවල ස්වභාවය අනුවත්, පාර්ශ්වකරුවන්ගේ සාමාජික හා ආර්ථික ප්‍රශ්න කෙරෙහි මැනවින් සැලකිල්ල යොමු කොට ණයකරු ණයහිමි දෙපාර්ශ්වයේම එකඟත්වයෙන් සාධාරණ බේරුම් කිරීමේ ක්‍රමයක් යෝජනා කිරීමට මණ්ඩලය ක්‍රියා කරයි. මණ්ඩලය මගින් කිසිදු ණය දීමක් හෝ මුදල් ආධාර දීමක් සිදු නොකෙරේ.

ණය සහනදායක මණ්ඩලය මගින් ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට යොමු කරනු ලැබේ. (පනතේ 21 වගන්තිය) :

(අ) ණයකරුට නිශ්චිත වශයෙන් ලැබුණු හෝ ණයට ගත් මුදල් ප්‍රමාණය ;
(ආ) ණය මුදලට නියම කරන ලද පොලියේ සාධාරණත්වය ;
(ඇ) ණය මුදල සම්බන්ධයෙන් ගෙවීමට එකඟවී ඇති පොලියේ ප්‍රමාණය ;
(ඈ) පොලී වශයෙන් හෝ වෙනත් ගාස්තු වශයෙන් දැනටමත් ගෙවා ඇති මුදල් ප්‍රමාණය ;
(ඉ) ණය මුදල දීමේදී ඊට පදනම් කරගත් විශේෂ කොන්දේසි ;
(ඊ) ණයකරුට මුදල් ගෙවීමේ ඇති හැකියාව ;
(උ) සැලකිල්ලට ගතහැකි යයි මණ්ඩලය අදහස් කරන වෙනත් කරුණු ;

සාධාරණ බේරුම් කිරීමකදී ණයහිමි පාර්ශ්වය එකඟ නොවන්නේ නම් අනුගමනය කරන පිළිවෙල :

යම් හෙයකින් මණ්ඩලය මගින් යෝජනා කෙරෙන සාධාරණ ණය බේරුම් කිරීමේ ක්‍රමයකට ණයහිමි එකඟ නොවන්නේ නම්, ඒ බව සඳහන් සහතිකයක් ණයකරු වෙත නිකුත් කරනු ලැබේ. පනතේ (32)2) වගන්තිය අනුව) එසේම ණයහිමි පාර්ශ්වය අවසාන විභාගය සඳහා නොපැමිණියහොත් ඒක පාක්ෂික විභාගයකින් අනතුරුව, ණයකරු වෙත ඉහත සඳහන් පරිදිම සහතිකය නිකුත් කෙරේ. (29 වගන්තිය අනුව) එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාමසේවා නිලධාරී තැන මගින්ද අවස්ථාවෝචිත පරිදි ණයහිමි වෙත දැනුම් දී ණයහිමි පාර්ශ්වය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යයි නිශ්චිත ලෙස මණ්ඩලයට ඒත්තු ගියහොත් පමණි. එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය හුදෙක්ම ණයකරු සතුවේ. මේ කාරණයම සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරිපිට විභාගයක් පැවැත්වෙන විට ණයකරු විසින් එම සහතිකය අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ණය මුදල් බේරුම් කර ගැනීම සඳහා වසර 10 ක උපරිමයකට යටත් කාල සීමාවක් ලබාදීමටත්, පොලිය අවම අනුපාතය දක්වා අඩු කිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත මගින් අධිකරණයට බලතල ලබා දී ඇත.

**මණ්ඩලයෙන් ලැබෙන සෙසු සහන**

ප්‍රධාන වශයෙන් ඉහත දැක්වූ සහනමය ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමේදී තවදුරටත් මහජනතාවට සහන සැලසෙන අන්දමින් මණ්ඩලය කටයුතු කරයි. ඉඩම් දේපළ සම්බන්ධයෙන් අධිකරණයක පැවැත්වෙන නීති කෘත්‍යවලදී, අදාළ දේපළවල වටිනාකමට සැසඳෙන මුද්දර ගාස්තු ආදී වියදම් දැරීමට සිදුවෙතත්, මණ්ඩලයේ නීති කටයුතු මුද්දර ගාස්තුවලින් නිදහස්ය. නොතීසි ගාස්තු වශයෙන් රුපියල් හතලිහක මුදලක් සහ ගැසට් ගාස්තු , දැන්වීම් ආදිය සඳහා ණය මුදල් ප්‍රමාණයට අනුරූප වන සේ සුළු මුදලක් පමණක් අයකෙරේ.

එමෙන්ම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ තමාටම කරුණු ඉදිරිපත් කළ හැකි අතර, නීතිඥ සහාය ලබාගැනීම අනිවාර්ය නොවේ. එහෙත් සංකීර්ණ නීතිමය ගැටළු ආදිය උද්ගත වන අවස්ථාවලදී, තම අභිමතය පරිදි තමා වෙනුවෙන් කිසියම් නීතිඥවරයකු මගින් කරුණු ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වයටම අවකාශ ඇත.

බේරුම් කිරීමකදී ණයකාර පක්ෂයට තම හැකියාවන් පරිදි වාරික ක්‍රමයක් මත ණය මුදල පියවාලීමට අවසර ලැබෙන අතර, ඉතාමත් සාධාරණ අනුපාතයක් දක්වා පොලිය අඩු කිරීමටද, කටයුතු කරනු ලැබේ. පොරොන්දු සින්නක්කරයක් මත ගත් ණයක් බේරුම් කිරීමේදී මණ්ඩලය මගින් පොරොන්දු සින්නක්කර ඔප්පුව උකසක් බවට පරිවර්තනය කිරීම ණයකාර පක්ෂය වෙත ලැබෙන සහනයක් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම සින්නක්කර ඔප්පු මත කෙරෙන ලද ණය ගණුදෙනු සම්බන්ධයෙන් මැදිහත්වීමට හැකි අයුරින් පනත සංශෝධනය වීමද ණයකරුවන්ට විශාල සහනයකි.

**ඔබෙන් ලැබිය යුතු සහාය**

මණ්ඩලය වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී, එම ඉල්ලුම්පත්‍රය සමඟ සපයා ඇති උපදෙස් හොඳින් කියවා බලා ඒ අනුව නිවැරැදිව හා පැහැදිලිව ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. මණ්ඩලය ක්‍රියා කරනු ලබන්නේ ඔබ සපයන තොරතුරු මත හෙයින් එසේ කිරීම විශේෂයෙන් වැදගත් වේ. ඉල්ලුම්පත්‍රය සමඟම අදාළ ඔප්පුවේ මුල් පිටපත හෝ සහතික පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, වඩාත් ඉක්මණින් ඉදිරිපත් කිරීම කඩිනමින් කටයුතු කිරීමට රුකුලක් වනු ඇත. පොරොන්දු සින්නක්කරයක කාලසීමාව ඉක්මවී යාමට පෙර ඉල්ලුම් කිරීම සැහෙතත් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමෙන් මණ්ඩලයේ කටයුතු වලට ඔබට සහාය විය හැකිය.

**සියලු විමසීම් :**

**ලේකම්,**
**ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,**
**අංක 35 ඒ, ආචාර්යය එන්.එම්.පෙරේරා මාවත,**
**කොළඹ 08.**

දුරකථන අංක **: 011 – 2697911**
ෆැක්ස් අංක **: 011 - 2697911**